# ශාස්ත්‍රවේදී උපාධිය අතුරු ව්‍යවස්ථා අංක 110-2022

## මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

## රුහුණ විශ්වවිද්‍යාලය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 වන වගන්තිය යටතේ සහ ඉන්පසුව සිදු කරන ලද සංශෝධන යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් .................. දින පනවන ලද අතුරු ව්‍යවස්ථාව.

## අතුරු ව්‍යවස්ථාව

මේ අතුරු ව්‍යවස්ථාව ශාස්ත්‍රවේදී උපාධිය පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලයේ අංක 110-2022 දරන අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙය 27.11.2021 දින සිට වලංගු වේ.

**1. උපාධිය පිරිනැමීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා**

1.1. අතුරු ව්‍යවස්ථාවට යටත් ව කිසියම් විද්‍යාර්ථියෙකු

(අ) රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් යථායෝග්‍ය පරිදි ලියාපදිංචි කරනු ලැබ ඇත්නම්

(ආ) රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇත්නම් හා ඒ ලියාපදිංචිය මේ අතුරු ව්‍යවස්ථාවෙන් නියම කරනු ලැබ ඇති අධ්‍යයන කාල සීමාව ඇතුළත වලංගු ව පැවතියේ නම්

(ඇ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම ලියාපදිංචි දින සිට ශාස්ත්‍රවේදී සාමාන්‍ය බාහිර උපාධියට අයත් සියලු පරීක්ෂණ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාලසීමාව තුළ සම්පූර්ණ කර ඇත්නම්

(ඈ) මේ අතුරු ව්‍යවස්ථාව ද ඒ යටතේ පනවා ඇති නියෝග හා රීති ද යන මේවායින් ඔහුට / ඇයට අදාළ වූ එක් එක් පරීක්ෂණය සඳහා නියම කර ඇති අධ්‍යයන පාඨමාලා රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සෑහීමට පත්වන අයුරින් සම්පූර්ණ කර ඇත්නම්

(ඉ) විශ්වවිද්‍යාලය මගින් නියම කරනු ලැබිය හැකි ගාස්තු හා විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු අනිකුත් ගාස්තු ගෙවා ඇත්නම්,

(ඊ) ඔහුට/ඇයට එරෙහිව විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන විනය පරීක්ෂණයක් නොමැති නම්

(උ) ඔහුට ඇයට එරෙහිව විශ්වවිද්‍යාලය මගින් විභාග අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණයක් නොමැති නම්

ඔහු/ඇය වෙත අදාළ වන පරිදි ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය (මින් ඉදිරියට "උපාධිය" යනුවෙන් හැඳින්වෙන) පිරිනැමිය හැකි ය.

1.2. මෙම අතුරු ව්‍යවස්ථාවට යටත් ව පිරිනැමෙන උපාධි නාමය වනුයේ ශාස්ත්‍රවේදී උපාධිය (බාහිර) [Bachelor of Arts Degree (External)] වේ.
මෙම උපාධිය සඳහා භාවිත වන කෙටි නාමය වන්නේ BA (External) වන අතර එය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව යටතේ 5 වන මට්ටමට (SLQF Level 5) අයත් වේ.

**2. අධ්‍යයන සැලැස්ම**

2.1 මෙම පාඨමාලාවේ අධ්‍යයන සැලැස්මට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ 01/2021 හා අනුගත විය යුතු ය.

2.2 මෙම අතුරු ව්‍යවස්ථාවට යටත් ව ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ තුනකින් සමන්විත පාඨමාලාවකි.

2.3 අධ්‍යයන වර්ෂ තුන පිළිවෙළින් 1000 ස්ථලය , 2000 ස්ථලය සහ 3000 ස්ථලය යන ස්ථල වශයෙන් නම් කොට ඇත. සෑම අධ්‍යයන වර්ෂයක් ම සමාසික දෙකකින් (02) යුක්ත වන අතර අධ්‍යයන වර්ෂ තුනට අයත් මුළු සමාසික සංඛ්‍යාව 06 ක් වේ.

2.4 සෑම ස්ථලයකම එක් එක් සමාසිකයට අදාළ පරීක්ෂණ එම සමාසික අවසානයේ පවත්වනු ලැබේ.

2.5 උපාධියට අදාළ සියලුම පාඨමාලා ඒකක (හර පාඨමාලා, පදනම් පාඨමාලා) සහ ඒවායේ විෂය නිර්දේශ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාවේ අනුමැතිය ලද ඒවා විය යුතු ය. සෑම විද්‍යාර්ථියකුම විසින් හැදෑරිය යුතු මුළු පාඨමාලා ඒකක මගින් සම්පූර්ණ කලයුතු අර්ස සංඛ්‍යාව 93 ක් වේ. මෙයට විෂයන් තුනෙහි අර්ස 72 සහ පදනම් පාඨමාලාවල අර්ස 18 සහ සීමාවාසික පුහුණුවේ අර්ස 3 ක් ඇතුලත් වේ.

2.6 සෑම විද්‍යාර්ථියෙකු ප්‍රථම අධ්‍යයන වර්ෂය, එනම් 1000 ස්ථලයෙහි ප්‍රථම සමාසිකය සඳහා තෝරා ගත් ප්‍රධාන විෂය තුන 2000 ස්ථලය හා 3000 ස්ථලය තුළ දී ද හැදෑරිය යුතු ය.

2.7 සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ දී ම එම අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යයන මණ්ඩලය මගින් වැඩසටහන් සම්බන්ධීකාරකගේ සහාය ඇතිව අධ්‍යයන කාලසටහනක් සැකසිය යුතු ය.

## 3. ලියාපදිංචි කිරීමේ පරිපාටිය සහ සුදුසුකම්

3.1 රුහුණ විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් අනුමත කරන ලද සුදුසුකම් ලබා ඇති අයට බාහිර අපේක්ෂකයන් වශයෙන් ලියාපදිංචි වීම පිණිස ඉල්ලුම් කළ හැකිය. සෑම පාඨමාලාවක් ම ආරම්භ කිරීම සඳහා අයදුම්පත් කැඳවීම පුවත්පත් දැන්වීම් හා විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවි මගින් දැනුවත් කරනු ලැබේ. අපේක්ෂකයන් ඒ අනුව නියමිත ආකෘති පත්‍ර (මුද්‍රිත ඉල්ලුම් පත්‍ර හෝ මාර්ගගත Online ඉල්ලුම් පත්‍ර) මගින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.

3.2 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයේ ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම

හෝ

රුහුණ විශ්වවිද්‍යාලය මගින් පිළිගෙන ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ ලබා තිබීම :

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම
(ආ) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම
(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු-ගුරු සහතිකය ලබා තිබීම
(ඈ) බෞද්ධ ධර්මාචාර්ය අවසාන පරීක්ෂණයෙන් සමත් වීම

හෝ

විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන විශේෂිත අවස්ථාවන් උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීමට මූලික සුදුසුකමක් වේ.

### 3.3 ප්‍රවේශ විභාගය

සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගෙන් ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා සිසුන් තෝරා ගැනීම, අවශ්‍යතාව පරිදි දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් අභියෝගතා පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් සිදු කරනු ඇත. උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචිවීමට එම පරීක්ෂණවලින් සමත්වීම අනිවාර්ය වේ.

3.4 මෙම උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ගත හැකි උපරිම සිසුන් සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 932 සහ 01/2021 චක්‍ර ලේඛයේ දක්වා ඇති ආකාරයට එම පාඨමාලාවට අභ්‍යන්තරව ලියාපදිංචි කර සිසුන් සංඛ්‍යාව මෙන් දෙගුණ විය යුතු ය.

3.5 උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනය වන විට සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් එම වර්ෂයේ ලියාපදිංචිය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3.6 ලියාපදිංචි කර ගැනීමේ දී සෑම උපාධි අපේක්ෂකයෙකුටම ලියාපදිංචි අංකයක් දෙනු ලැබේ. එම ලියාපදිංචි අංකය සහිතව තාවකාලික ලියාපදිංචි කිරීමේ ලිපියක් පළමුව නිකුත් කරනු ලබන අතර, එය ශිෂ්‍ය වාර්තාපොත නිකුත් කරන තෙක් වලංගු වේ. කිසියම් අපේක්ෂකයෙකු විභාග සම්බන්ධයෙන් කරනු ලබන සෑම විමසීමක දී මෙම අංකය සඳහන් කිරීම අනිවාර්ය වේ.

3.7 ලියාපදිංචි වන සෑම උපාධි අපේක්ෂකයෙකුටම ශිෂ්‍ය වාර්තා පොතක් සහ ශිෂ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ.

3.8 ලියාපදිංචිය සිදුකරන දින සිට අධ්‍යයන වර්ෂ තුනක් (03) ක් අවසාන වන තුරු ශාස්ත්‍රවේදී උපාධි අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය වලංගු වනු ඇත.

3.9 බාහිර අපේක්ෂකයෙකුගේ ප්‍රථම ලියාපදිංචිය වලංගු කාලසීමාව තුළ උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අපේක්ෂකයකුට තව දුරටත් විභාග සඳහා පෙනී සිටීමට අවශ්‍ය නම් අවසාන ප්‍රතිඵල නිකුත් වී මාස 2 ක් ඇතුළත ලියාපදිංචිය අලුත් කර ගැනීමට නියමිත ආකෘති පත්‍රය (SE-4) මගින් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන් ඉල්ලුම් කළ යුතු ය. මෙසේ ලියාපදිංචිය දීර්ඝ කර ගත හැක්කේ ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට උපරිම අධ්‍යයන වර්ෂ හයක් (06) ගතවන තුරු පමණි.

3.10 ඕනෑම බාහිර උපාධි අපේක්ෂකයෙකුට තම අභිමතය පරිදි දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන් ලිඛිත ඉල්ලීමක් සිදුකර තම ලියාපදිංචිය අවලංගු කරවා ගත හැකි ය. පරීක්ෂණයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින හෝ විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගයන් ගැනීමට නියමිතව ඇති අපේක්ෂකයෙකු විසින් කරනු ලබන එවැනි ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද, ලියාපදිංචිය අවලංගු කරවා ගැනීමට කරනු ලබන ඉල්ලීමක දී ආපසු ගෙවීමට එකග වූ ගාස්තු හැර වෙනත් කිසිඳු ගාස්තුවක් ආපසු ගෙවනු නොලැබේන අතර සමාසිකයේ අධ්‍යනය කටයුතු ආරම්භ කර සති දෙකකින් පසුව ගාස්තු ආපසු ගෙවීම සිදු නොකරයි

3.11 ලියාපදිංචි වූ කිසියම් ශිෂ්‍යයෙකු යම් විනය විරෝධී ක්‍රියාවකට හෝ සාපරාධී ක්‍රියාවකට වැරදිකරු වූ බව සනාථ වුවහොත් ඔහුගේ හෝ ඇයගේ ශිෂ්‍යභාවය පවත්වාගෙන යාම සහ උපාධිය පිරිනැමීම පිළිබඳව විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් සහ පාලක සභාව විසින් ගනු ලබන තීරණවලට යටත් වන්නේ ය.

## 4. සමාසිකයකට අදාළ පාඨමාලා ඒකක සහ විභාග සඳහා ලියාපදිංචිවීම සහ ඇගයුම් පරීක්ෂණ සඳහා පෙනී සිටීම

### 4.1 විෂයන් සහ පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම

4.1.1 විෂයන් තෝරා ගැනීම 110.1-2022 දරන පාඨමාලා ඒකක ක්‍රමය පිළිබඳ මාර්ගෝපදේශ අනුව සිදු කල යුතුය.

4.1.2 පාඨමාලා ඒකක ක්‍රමය පිළිබඳ පොදු උපදෙස් හා නිර්ණායක පාඨමාලා ඒකක පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි (110.1-2022) 7 වන වගන්තියට අදාල උප වගන්තීන්හි සඳහන් වන ආකාරයට සෑම විද්‍යාර්ථියෙකුම සමාසිකයක් ආරම්භයේ සිට අධ්‍යයන මණ්ඩලය විසින් නියම කරන ලද සති දෙකක කාල සීමාවක් තුළ, අදාළ ස්ථලයේ එම සමාසිකයට නියමිත සියලුම පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි විය යුතු ය.

4.1.3 යම් විද්‍යාර්ථියකු වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් හෝ සනාතන සභාවට පිළිගත හැකි හේතුවක් මත හෝ යම් සමාසිකයක් සඳහා ලියාපදිංචිවීමට නොහැකි තත්ත්වයක් තිබේ නම්, අධ්‍යයන වර්ෂයක් කල් ලබාගැනීම සඳහා නීත්‍යානුකූල ඉල්ලීමක් සහකාර ලේඛකාධිකාරී/ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත කළ යුතුය.

4.1.4 ඉහත අකාරයට කරන ලද ඉල්ලීම් ඒකකයේ දුක්ගැනිවිලි කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශ අධ්‍යයන මණ්ඩල සහ පීඨ මණ්ඩල නිර්දේශ මත සනාථන සභාවේ අනුමැතිය ලබා ගත යුතු ය.

4.2 **අඛණ්ඩ ඇගයුම්**

4.2.1 විද්‍යාර්ථියෙකු නිශ්චිත පාඨමාලා ඒකකයක් සඳහා පවත්වනු ලබන අඛණ්ඩ ඇගයුම් සඳහා වෛද්‍ය හේතූන් නිසා හෝ අධ්‍යයන මණ්ඩලයට සහ පීඨ මණ්ඩලයට සෑහීමකට පත්විය හැකි වෙනත් හේතුවක් නිසා හෝ පෙනී සිටීමට අපොහොසත් වුවහොත් 110.1-2022 දරන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වගන්ති ප්‍රකාර ව එම සමාසිකය තුළදී ම, එම ඇගයීම සඳහා නැවත ඇගයීමක් පවත්වන මෙන් සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත එම ඇගයීම පැවැත්වූ දින සිට සති දෙකක කාලයක් තුළ ලිඛිත ඉල්ලීමක් කළ හැකි ය. අධ්‍යයන මණ්ඩලයේ ශිෂ්‍ය අභියාචනා කමිටුවේ නිර්දේශ සහිතව අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ලැබෙන එබඳු ඉල්ලීම් සඳහා එම සමාසිකය තුළ අඛණ්ඩ ඇගයීමක් පැවැත්වීමට අදාළ සම්බන්ධීකාරකගේ අධීක්ෂණයෙන් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් කටයුතු කරනු ලැබේ.

4.2.2 සමාසික අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට අවසර ඇත්තේ සියලුම අඛණ්ඩ ඇගයුම් සඳහා පෙනී සිටි විද්‍යාර්ථීන්ට පමණි.

4.2.3 (i) විභාග පූර්ව අවශ්‍යතාවයක් ලෙස අඛණ්ඩ ඇගයුම් සම්පූර්ණ නොකිරීමේ හේතුවෙන් සමාසික අවසන් පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන (Not Allowed) සිසුන්ට අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාවක් නොලැබෙන අතර ඔවුන් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබන සිසුන් (NE-Not Eligible) ලෙස සඳහන් කරනු ලැබේ. එහෙත් අඛණ්ඩ ඇගයුම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඊළඟ අධ්‍යයන කණ්ඩායම (**next batch**) සමග අදාළ සමාසිකය තුළ පැවැත්වෙන පරීක්ෂණ සඳහා පුනර් ශිෂ්‍යයෙකු ලෙස පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ඇත.

(ii) වෛද්‍ය හේතූන් මත හෝ වෙනත් පිළිගත හැකි අත්‍යවශ්‍යම හේතුවක් මත අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සමාසික අවසන් පරීක්ෂණය සඳහා පෙනී නොසිටි සිසුන් පළමුවර පෙනී සිටින සිසුවෙකු ලෙසට සලකනු ලැබේ.

**4.3 සමාසික අවසාන පරීක්ෂණ**

4.3.1 සියළුම සිසුන් සමාසික පරීක්ෂණ සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය නිකුත් කරන නිවේදනයන්ට අදාළව මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම් කළ යුතුය.

4.3.2 එක් එක් සමාසිකයට අදාළ සමාසික අවසාන පරීක්ෂණ සමාසිකය අවසානයේ දී පවත්වනු ලැබේ. විද්‍යාර්ථියෙකු ඔහුට/ඇයට නියමිත පාඨමාලා ඒකකයේ සමාසික අවසාන පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අපොහොසත් වුවහොත්, ඉදිරි පරීක්ෂණයකට පෙනී සිටීමේ දී පුනර් ශිෂ්‍යයෙකු සේ සළකනු ලැබේ. එනමුදු අදාළ අධ්‍යයන මණ්ඩලයේ සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ මණ්ඩලයේ නිර්දේශය සහ සනාතන සභාවේ අනුමැතිය ලද වෛද්‍ය හෝ වෙනත් හේතුවක් මත මීළඟට එළැඹෙන ආසන්නතම අවස්ථාවේ දී එම සමාසික අවසාන පරීක්ෂණයට ප්‍රථමවරට පෙනී සිටින අපේක්ෂකයෙකු ලෙස පෙනී සිටීමට අවකාශ ඇත. ඒ සඳහා 110.1-2022 දරණ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන වගන්තිය ප්‍රකාර ව ඉල්ලීමක් කළ යුතු ය.

4.3.3 සමාසික අවසාන පරීක්ෂණයෙන් අසමත් වූ සියලු පාඨමාලා ඒකක සඳහා පුනර් පරීක්ෂණ නොපැවැත්වෙන අතර එම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යයෙන් ම ඊට අදාළ පරීක්ෂණ පැවැත්වෙන ඊළඟ පළමු අවස්ථාවේදී ඒ සඳහා පෙනී සිටිය හැකිය.

4.3.4 අසමත් වූ පාඨමාලා ඒකකයක පරීක්ෂණය වෙනුවෙන් නැවත පෙනී සිටින විට අඛණ්ඩ ඇගයුම් සඳහා ප්‍රථම වතාවේ දී ලැබූ ලකුණ එලෙසම සැලකිල්ලට ගනු ලැබේ. එසේ වුවද විද්‍යාර්ථයාගේ අභිමතය පරිදි අඛණ්ඩ ඇගයීම් සඳහා නැවත පෙනී සිටීමට හැකි ය. එවැනි අවස්ථාවක දී අඛණ්ඩ ඇගයුම් සඳහා ලබා ගන්නා ලද ඉහලම ලකුණු ප්‍රමාණය විෂය සාමාර්ථය තීරණය සඳහා සලකා බලනු ලැබේ.

4.3.5 සිසුන් විසින් පාඨමාලා ඒකකයක් සඳහා නැවත වතාවක් පෙනී සිටින අවස්ථාවේදී ලබා ගන්නා විෂය සාමාර්ථය, ඊට පූර්ව ගත් විෂය සාමාර්ථයට වඩා අවම අගයක් ඇති අවස්ථාවක, එම විෂයට පෙර ලබා ගත් වැඩිම අගය අවසාන ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

**5. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහය හා සංයුතිය**

5.1 ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගැනීම සඳහා විෂයානුබද්ධ අර්ස සංඛ්‍යාව 72 ක් ද පදනම් පාඨමාලා ඒකක අර්ස 18 ක්ද සීමාවාසික පුහුණුව මගින් අර්ස 03 ද සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව උපාධිය සඳහා සම්පූර්ණ කළ යුතු පාඨමාලා ඒකකවලට අදාළ අර්ස සංඛ්‍යාව 93 කි.

**වගුව 1 ඃ ශාස්ත්‍රවේදී උපාධියට අයත් පාඨමාලා වර්ග**
**හැදෑරිය යුතු අවම පාඨමාලා ඒකක සංඛ්‍යාව සහ අර්ස සංඛ්‍යාව**

| පාඨමාලා වර්ගය | පාඨමාලා ඒකක | මුළු අර්ස සංඛ්‍යාව |
|---|---|---|
| අනිවාර්ය හර පාඨමාලා | 24 (8ඃ3) | 72 (24ඃ3) |
| පදනම් පාඨමාලා- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 03 | 09 (3ඃ3) |
| පදනම් පාඨමාලා- ඉංග්‍රීසි භාෂාව | 03 | 09 (3ඃ3) |
| අනිවාර්ය සීමාවාසික පුහුණුව* | 01 | 03 (1ඃ3) |
| **එකතුව** | **31** | **93** (31ඃ3) |

*මෙය අර්ස සහිත පාඨමාලා ඒකකයක් වන අතර සමස්ත GPA අගය ගණනය සඳහා මෙම පාඨමාලා ඒකකය සලකා බලනු නොලැබේ

**වගුව 2; ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවට අදාළ අර්ස සංඛාව ( විෂයන් හා පාඨමාලා වර්ග අනුව)**

| | විෂයන් සහ පාඨමාලා | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | විෂය 01 | විෂය 02 | විෂය 03 | ඉංග්‍රීසි (ELG) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ITS) | අනිවාර්ය සීමාවාසික පුහුණුව | මුළු අර්ස සංඛ්‍යාව |
| 01 | 06 | 06 | 06 | 03 | 03 | -- | 24 |
| 02 | 09 | 09 | 09 | 03 | 03 | -- | 33 |
| 03 | 09 | 09 | 09 | 03 | 03 | 03 | 36 |
| මුළු අර්ස සංඛ්‍යාව | 24 | 24 | 24 | 09 | 09 | 03 | 93 |

ශාස්ත්‍රවේදී උපාධියට අයත් පාඨමාලා වර්ග සහ පාඨමාලා ඒකක සංඛ්‍යාව ඒ ඒ සමාසික තුළ

බෙදී යන ආකාරය වගුව 3 හි දැක්වේ.

**වගුව 3 ඃ ශාස්ත්‍රවේදී උපාධියට අයත් පාඨමාලා වර්ග සහ එම පාඨමාලා ඒකක සමාසික අතර බෙදී යන ආකාරය**

| පාඨමාලාව | | ප්‍රථම වර්ෂය ( 1000 ස්ථලය) පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාව (Credits - C) | | දෙවන වර්ෂය ( 2000 ස්ථලය) පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාව | | තුන්වන වර්ෂය ( 3000 ස්ථලය) පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාව | | පාඨමාලා ඒකක ගණන සහ අර්ස සංඛ්‍යාවල එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | සමාසිකය 1 | සමාසිකය 2 | සමාසිකය 1 | සමාසිකය 2 | සමාසිකය 1 | සමාසිකය 2 | |
| විෂය සම්බන්ධිත හර පාඨමාලා | ප්‍රධාන විෂය - 1 | 1(3C) | 1(3C) | 1(3C) | 2(2x3=6C) | 1(3C) | 2(2x3=6C) | 8(24C) |
| | ප්‍රධාන විෂය - 2 | 1(3C) | 1(3C) | 1(3C) | 2(2x3=6C) | 1(3C) | 2(2x3=6C) | 8(24C) |
| | ප්‍රධාන විෂය - 3 | 1(3C) | 1(3C) | 1(3C) | 2(2x3=6C) | 1(3C) | 2(2x3=6C) | 8(24C) |
| පදනම් පාඨමාලා | ඉංග්‍රීසි භාෂාව (English) | 1(3C) | -- | 1(3C) | -- | 1(3C) | -- | 3(9C) |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) | -- | 1(3C) | 1(3C) | -- | 1(3C) | --- | 3(9C) |
| අනිවාර්ය සීමාවාසික පුහුණුව | | -- | -- | -- | -- | -- | 1(3C) | 1(3C) |
| **එකතුව** | | **4(12C)** | **4(12C)** | **5(15C)** | **6(18C)** | **5(15C)** | 7(21C) | 31(93C) |

*සටහන 1ඃ වරහන් තුළ දක්වා ඇත්තේ පාඨමාලා ඒකකය තුළ අන්තර්ගත අර්ස සංඛ්‍යාවයි*

## 6. ඇගයුම් සහ ශ්‍රේණිගත කිරීම

6.1 උපාධිය සඳහා නියමිත සියලු පරීක්ෂණ අඛණ්ඩ ඇගයීම් සහ සමාසික අවසාන පරීක්ෂණවලින් යුක්ත වන අතර අඛණ්ඩ ඇගයීම් අදාළ සමාසිකය තුළ දී ද සමාසික අවසාන පරීක්ෂණ සමාසිකය අවසානයේ දී පවත්වනු ලැබේ.

6.2 මෙම අතුරු ව්‍යවස්ථාව මගින් හා ඒ යටතේ පනවනු ලබන නියෝගවලින් නියම කරනු ලබන සමාසික අවසාන පරීක්ෂණ පීඨ මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාවෙන් අනුමත කරනු ලබන සුදුසුකම් සහිත පරීක්ෂක මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.

6.3 ඇගයුම් ක්‍රමය

පාඨමාලා ඒකකවල ඇගයුම් ක්‍රමය පාඨමාලා ඒකක අනුව වෙනස් විය හැකි ය. එහෙත් පොදුවේ සෑම පාඨමාලා ඒකකයක ම ඇගයුම් ක්‍රමය පහත සඳහන් (අ) (ආ) යන ප්‍රධාන සංරචක කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

(අ) **අඛණ්ඩ ඇගයුම්** : වාචික පරීක්ෂණ, පන්ති කාමර පරීක්ෂණ, වාර්තා (Reports) ඉදිරිපත් කිරීම්, (Presentations) සහ ක්ෂණික පරීක්ෂණ (Quizzes), ක්ෂේත්‍ර කටයුතු (field works) සහ විවෘත ග්‍රන්ථ පරීක්ෂණය (Open Book Tests) යනාදිය පළමු සංරචකයට අයත් වන අතර, සියලුම පාඨමාලා ඒකක සඳහා ලබාදිය යුතු අඛණ්ඩ ඇගයුම් අදාළ පාඨමාලාවේ සම්බන්ධීකාරක විසින් තීරණය කර සමාසිකය ආරම්භයේ දී අධ්‍යයන මණ්ඩලයට දැනුවත් කළ යුතු ය. එක් පාඨමාලා ඒකකයක් වෙනුවෙන් අවම වශයෙන් ඇගයුම් දෙකක්වත් පැවැත්විය යුතු අතර අඛණ්ඩ ඇගයුම් සඳහා හිමිවන මුළු ලකුණු සංඛ්‍යාව 40 කි. ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය යනාදී පදනම් පාඨමාලා සඳහා ද මෙම කොන්දේසි අදාළ වේ.

(ආ) **සමාසික අවසාන පරීක්ෂණය:**

සමාසික අවසාන පරීක්ෂණය ප්‍රායෝගික හෝ/සහ ලිඛිත හෝ විය හැකි ය. ඒ ඒ පාඨමාලා ඒකක සඳහා පැවැත්විය යුතු පරීක්ෂණවල ස්වරූපය අදාළ පාඨමාලාවේ සම්බන්ධීකාරක විසින් තීරණය කර සමාසිකය ආරම්භයේදී දැනුවත් කළ යුතුය. ලිඛිත පරීක්ෂණයේදී පැය 2 ප්‍රශ්න පත්‍රයක් ද ප්‍රායෝගික පරීක්ෂණවලදී පැය 2-3 අතර කාලයකට අදාළ වන ලෙසට සැකසිය යුතුයි. ලිඛිත පරීක්ෂණයේදී ක්‍රෙඩිට් 3 ක පාඨමාලා ඒකකයක් සඳහා ප්‍රශ්න 6-7 කින් ප්‍රශ්න 4 කට පිළිතුරු සැපයීම ලෙසට ප්‍රශ්න පත්‍ර සැකසිය යුතුයි. සමාසික අවසාන පරීක්ෂණය සඳහා පිරිනැමෙන මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.

වෛද්‍ය හෝ වෙනත් පිළිගත හැකි හේතුවක් නිසා කිසියම් ශිෂ්‍යයෙකුට සමාසික අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වුවහොත් විභාගය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුලත දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයෙහි සහකාර ලේඛකාධිකාරී වෙතට අදාළ තොරතුරු සහිතව අභියාචනාවක් ඉදිරිපත් කල යුතුය. ඒ සඳහා පීඨ මණ්ඩලයේ නිර්දේශය සහිතව සනාතන සභාවේ අනුමැතිය ලබා ගත යුතු අතර එහි අනුමැතිය ලද හොත් විභාග අපේක්ෂකයාට ඊලග වතාවට විභාගය පැවැත්වෙන අවස්ථාවේදී පළමු වරට පෙනී සිටින ශිෂ්‍යයෙකු සේ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලැබෙනු ඇත. සනාතන සභාවේ අනුමැතිය නොලදහොත් එම අපේක්ෂකයා ඊලග පරීක්ෂණයේදී පුනර් ශිෂ්‍යයකු සේ සලකනු ලැබේ

### 6.4 ශ්‍රේණි ගත කිරීම

6.4.1 ඒ ඒ පාඨමාලා ඒකකය පිළිබඳ ඇගයුම් කරනු ලැබෙන්නේ ප්‍රධාන පරීක්ෂකගේ අධීක්ෂණය යටතේ අදාළ පරීක්ෂකවරුන් විසිනි. 0% - 100% දක්වා වූ ලකුණු පරාස භාවිත කරමින් ඇගයුම් කරනු ලැබෙන අතර ලබාගන්නා ලකුණු ප්‍රමාණය මත අදාළ ශ්‍රේණිය (Grade) හා ශ්‍රේණි ලක්ෂ්‍ය අගය (Grade Point Value) නිර්ණය කෙරේ. අදාළ ශ්‍රේණි හා ශ්‍රේණි ලක්ෂ්‍ය අගය වගුව 3 හි පෙන්නුම් කරයි.

**වගුව 3 ඃ ශ්‍රේණි හා ශ්‍රේණි ලක්ෂ්‍ය අගය**

| ලකුණු පරාසය | ශ්‍රේණිය (Grade) | ශ්‍රේණි ලක්ෂ්‍ය අගය (Grade Point Value) |
|---|---|---|
| 85 - 100 | A+ | 4.00 |
| 70 - 84 | A | 4.00 |
| 65 - 69 | A- | 3.70 |
| 60 - 64 | B+ | 3.30 |
| 55 - 59 | B | 3.00 |
| 50 - 54 | B- | 2.70 |
| 45 - 49 | C+ | 2.30 |
| 40 - 44 | C | 2.00 |
| 35 - 39 | C- | 1.70 |
| 30 - 34 | D+ | 1.30 |
| 25 - 29 | D | 1.00 |
| 00 - 24 | E | 0.00 |
| | E* | |

| | |
|---|---|
| ප්‍රතිඵල අත්හිටුවා ඇත. (Results Withheld) | WH |
| ඉල්ලුම් කර නැත (Not Applied) | NA |
| පිළිගත හැකි හේතුවක් නොමැතිව නොපැමිණීම (Absent without accepted reason) | AB |
| මූලික සුදුසුකම් සපුරා නැත ( Not Eligible)/ අඛණ්ඩ ඇගයීම් පමණක් සම්පූර්ණ කර ඇත. (Only the continuous assessments are completed) | NE |
| පිළිගත හැකි වෛද්‍ය සහතික ඉදිරිපත් කර ඇත. (Accepted Medical Certificate) | MC |

6.4.2 එක් එක් සමාසිකය අවසානයේ දී ඒ ඒ සමාසිකය තුළ විද්‍යාර්ථීන් විසින් හදාරන ලද සියලුම පාඨමාලා ඒකකවල ශ්‍රේණි ලක්ෂ්‍යය අගයන්හි සාමාන්‍යය (Grade Point Average - GPA) ගණනය කෙරේ.

එසේම උපාධි පාඨමාලාව මුළුමනින් ම අවසන් කළ විට ද, සමස්ත පාඨමාලාව තුළ විද්‍යාර්ථීන්ගේ සාධන මට්ටම ඇගයීම සඳහා GPA ගණනය කරනු ලැබේ. අවසාන සාධන මට්ටම සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ද, ගෞරව සාමාර්ථ්‍යයක් ද යන්න නිර්ණය කිරීම සඳහා GPA භාවිතා කරනු ලැබේ.

6.4.3 ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය යනු ශ්‍රේණි ලක්ෂ්‍ය අගයයන්, අර්ස අගයයන්ගෙන් බර තබන ලද අංක ගණිතමය මධ්‍යන්‍ය (GPA is the credit - weighted arithmetic mean of grade point values) යි. මෙය පහත සමීකරණයේ දැක්වෙන ආකාරයට ගණනය කෙරේ.

$$\text{ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍ය} = \frac{\sum (\text{පාඨමාලා ඒකකය සඳහා ලබා ගත් ශ්‍රේණි ලක්ෂ්‍ය අගය}_i \times \text{අර්ස ප්‍රමාණය}_i)}{\text{මුළු අර්ස ප්‍රමාණය}}$$

$$G.P.A = \frac{\sum C_i PV_i}{\sum C_i}$$

$GPV_i$ = සලකා බලන පාඨමාලාව සඳහා ලබා ගත් ශ්‍රේණි ලක්ෂ අගය
$C_i$ = i වෙනි පාඨමාලාවට අයත් අර්ස සංඛ්‍යාව
GPA අගය දසමස්ථාන දෙකක් දක්වා සකස් කල යුතු ය.

6.4.4 කිසියම් පාඨමාලා ඒකකයක් සමත්වීම සඳහා අවම වශයෙන් C සාමාර්ථ්‍යයක් ලබා ගත යුතු අතර C- හෝ ඊට වඩා අඩු සාමාර්ථ්‍යයක් ලබා ගතහොත් නැවත වරක් විභාගයට පෙනී සිට එය සමත් කර ගත යුතුය.

6.4.5 ද, පුනර් පරීක්ෂණයකදී පාඨමාලා ඒකකය සඳහා C සාමාර්ථ්‍යයකට වඩා ඉහළ සාමාර්ථ්‍යයක් හිමි කර ගනු ලැබුව ප්‍රදානය කරනු ලබන ඉහළම සමාර්ථය "C" වන අතර හිමි වන GPA අගය 2.00 ක් වේ.

## 7. සාමර්ථ්‍යය ප්‍රදානය

### 7.1 සාමාන්‍ය සාමර්ථ්‍යය ප්‍රදානය

(අ) ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය ලබාගනීම සඳහා විද්‍යාර්ථියකු වසින් අවම වශයෙන් නියමිත අධ්‍යයන කාලය තුළදී අර්ස 93 ක් සම්පූර්ණ කළ යුතු ය.

(ආ) සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා විද්‍යාර්ථියා අවම වශයෙන් 2.00 ක් වූ GPA අගයක් ලබා ගත යුතු අතර මුලු සාමාර්ථ්‍ය සංඛ්‍යාවෙන් (හර සහ පදනම් පාඨමාලා ඒකක) සඳහා C- සමාර්ථ දෙකකට වඩා ලබා නොතිබිය යුතු ය.

### 7.2 පංති සාමාර්ථ්‍යය ප්‍රදානය

ඉහත 7.1 සුදුසුකම් අධ්‍යයන වර්ෂ 3 ක් තුළ දී සපුරා ලූ විද්‍යාර්ථීන්ට පහත වගුවේ සඳහන් පරිදි පංති සාමාර්ථ්‍යයක් ප්‍රදානය කරනු ලැබේ.

| GPA | පංති සාමාර්ථ්‍යය ප්‍රදානය |
| --- | --- |
| GPA >= 3.70 | ප්‍රථම පංති සාමාර්ථ්‍යය |
| 3.30=<GPA<3.70 | දෙවන පෙළ (ඉහළ) පංති සාමාර්ථ්‍යය |
| 3.00=<GPA<3.30 | දෙවන පෙළ (පහළ) පංති සාමාර්ථ්‍යය |

### 9. අධ්‍යයන මාධ්‍යය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලා **සිංහල** මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

### 10. සාමාන්‍ය විධි විධාන

10.1 මෙම අතුරු ව්‍යවස්ථාව 2020 වර්ෂයේ සිට බඳවා ගනු ලබන 19 වන ශිෂ්‍ය කණ්ඩායමේ සිට ක්‍රියාත්මක වනු ඇත.

10.2 උපාධිය සඳහා අදාළ වන නියමිත විෂයයන්, ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව, ඇගයීමේ ක්‍රම, අධ්‍යයන පාඨමාලා සහ විෂය නිර්දේශ වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට, එකතු කිරීමට හෝ එකී කිසියම් පරීක්ෂණයකට අදාළ නියෝග හා රීති වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ අලුතෙන් එකතු කිරීමට හෝ අධ්‍යයන මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාවට බලය තිබේ.

### 11. අර්ථ නිරූපණය.

මේ අතුරු ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණයට අදාළ යම් නිරාකරණය කර ගැනීමක් අවශ්‍ය වුවහොත් පාලක සභාව වෙත යොමු කළ යුතු ය. ඒ පිළිබඳ ව පාලක සභාවේ තීරණය අවසාන තීරණය වේ.

### 12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ:

"විශ්වවිද්‍යාලය" යන්නෙන් රුහුණ විශ්වවිද්‍යාලය අදහස් වේ.

"පාලක සභාව" යන්නෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ.

"සනාතන සභාව" යන්නෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අදහස් වේ.

"පීඨය" යන්නෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය අදහස් වේ.

"අධ්‍යයන මණ්ඩලය" යන්නෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවේ අධ්‍යයන මණ්ඩලය අදහස් වේ.

"විද්‍යාර්ථියා" යන්නෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ බාහිර ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක ලෙස ලියාපදිංචි වූ අයකු අදහස් වේ.

## ශාස්ත්‍රවේදී උපාධිය

## නියෝග අංක 110.2-2022

## දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

## රුහුණ විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය පිළිබඳ අංක 110-2022 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ පිළියෙල කළ අංක 110.2-2022 දරන ලියාපදිංචි කිරීම, පරීක්ෂණ පරිපාටිය, ප්‍රතිඵල නිර්ණය කිරීම හා ලියාපදිංචි හා පරීක්ෂණ ගාස්තු පිළිබඳ වූ නියෝග.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 වගන්තිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පනවන ලද නියෝග,

01. මෙම නියෝග ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය සඳහා අදාළ ලියාපදිංචි කිරීම, පරීක්ෂණ පරිපාටිය, ප්‍රතිඵල නිර්ණය කිරීම හා ලියාපදිංචි හා පරීක්ෂණ ගාස්තු පිළිබඳ වූ අංක 110.2-2022 දරන නියෝගය යනුවෙන් හඳුන්වනු ලැබේ.

**02. ලියාපදිංචි කිරීමේ පරිපාටිය සහ සුදුසුකම්**

2.1 රුහුණ විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාවට අදාළ පරීක්ෂණ වලට පෙනී සිටීම සඳහා විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් අනුමත කරන ලද සුදුසුකම් ලබා ඇති අයට බාහිර අපේක්ෂකයන් වශයෙන් ලියාපදිංචි වීම පිණිස ඉල්ලුම් කළ හැකිය. එක් එක් වර්ෂය ආරම්භයේ දී බාහිර අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීම් හා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ වෙබ් අඩවිය මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. බාහිර අපේක්ෂකයන් ඒ අනුව නියමිත ආකෘති පත්‍ර (මුද්‍රිත ඉල්ලුම් පත්‍ර හෝ මාර්ගගත (on line) ඉල්ලුම් පත්‍ර) මගින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය. සෑම වර්ෂයක ම පුවත්පත් දැන්වීම් මගින් හා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ වෙබ් අඩවියේ අයදුම්පත් කැඳවීමේ නිවේදන ප්‍රසිද්ධ කරනු ලැබේ.

2.2 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයේ දී ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම

හෝ

රුහුණ විශ්වවිද්‍යාලය මගින් පිළිගෙන ඇති පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ ලබා තිබීම :

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම
(ආ) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම
(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු-ගුරු සහතිකය ලබා තිබීම
(ඈ) බෞද්ධ ධර්මාචාර්ය අවසාන පරීක්ෂණයෙන් සමත් වීම

හෝ

විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන විශේෂිත අවස්ථාවන් උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීමට මූලික සුදුසුකමක් වේ.

උපාධි පාඨමාලාවට ප්‍රවේශීම සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (Sri Lanka Qualifications Framework) සඳහන් වන අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම ( SLQF Level 4 හෝ NVQF Level 6 සමත් වීම)

හෝ

විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීමට මූලික සුදුසුකමක් වේ.

2.3 **ප්‍රවේශ විභාගය**

සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගෙන් ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ගන්නා සිසුන් තෝරා ගැනීම, අවශ්‍යතාව පරිදි දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් අභියෝගතා පරීක්ෂණ / ප්‍රායෝගික පරීක්ෂණ / සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් සිදු කරනු ඇත. උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට එම පරීක්ෂණයවලින් සමත්වීම අනිවාර්ය වේ.

2.4 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අධ්‍යයන මණ්ඩලයේ සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාව විසින් එක් එක් අධ්‍යයන වර්ෂයේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කරගන්නා සිසුන් සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

2.5 උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දින වන විට සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් එම වර්ෂයේ ලියාපදිංචිය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

2.6 ලියාපදිංචි කර ගැනීමේ දී සෑම ශිෂ්‍යයෙකුටම ලියාපදිංචි අංකයක් දෙනු ලැබේ. එම ලියාපදිංචි අංකය සහිතව තාවකාලික ලියාපදිංචි කිරීමේ ලිපියක් පළමුව නිකුත් කරනු ලබන අතර, එය ශිෂ්‍ය වාර්තාපොත නිකුත් කරන තෙක් වලංගු වේ. අපේක්ෂකයෙකු විභාග සම්බන්ධයෙන් කරනු ලබන සෑම විමසීමකටම මෙම අංකය සඳහන් කිරීම අනිවාර්ය වේ.

2.7 ලියාපදිංචි වන සෑම උපාධි අපේක්ෂකයෙකුටම ශිෂ්‍ය වාර්තා පොතක් නිකුත් කරනු ලැබේ.

2.8 ලියාපදිංචිය සිදුකරන දින සිට අධ්‍යයන වර්ෂ තුනක් (03) ක් අවසාන වන තුරු ශාස්ත්‍රවේදී අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය වලංගු වනු ඇත.

2.9 උපාධි අපේක්ෂකයෙකුගේ ප්‍රථම ලියාපදිංචි වලංගු කාලසීමාව තුල උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අපේක්ෂකයකු තව දුරටත් විභාග සඳහා පෙනී සිටීමට අවශ්‍ය නම් අවසාන ප්‍රතිඵල නිකුත් වී මාස 2ක් ඇතුලත ලියාපදිංචිය අලුත් කර ගැනීමට නියමිත ආකෘති පත්‍රය ( SE - 4 ) මගින් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන් ඉල්ලුම් කළ යුතුය. මෙසේ ලියාපදිංචිය දීර්ඝ කර ගත හැක්කේ ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට උපරිම අධ්‍යයන වර්ෂ හයක් ගතවන තුරු පමණි.

2.10 ඕනෑම උපාධි අපේක්ෂකයෙකුට තම අභිමතය පරිදි දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන් ලිඛිත ඉල්ලීමක් සිදුකර තම ලියාපදිංචිය අවලංගු කරවා ගත හැකිය. පරීක්ෂණයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින හෝ විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගයන් ගැනීමට නියමිතව ඇති අපේක්ෂකයෙකු විසින් කරනු ලබන එවැනි ඉල්ලීමක් සළකා බලනු නොලැබේ. තවද, ලියාපදිංචිය අවලංගු කරවා ගැනීමට කරනු ලබන ඉල්ලීමකදී ලියාපදිංචි ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

2.11 ලියාපදිංචි වූ කිසියම් ශිෂ්‍යයෙකු සම්බන්ධව යම් විනය විරෝධී ක්‍රියාවක් වාර්තා වුවහොත් ශිෂ්‍යභාවය පවත්වාගෙන යාම සහ උපාධිය පිරිනැමීම පිළිබඳව විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පනවනු ලබන නීතිමය දඬුවම්වලට යටත් වන්නේය.

03. **අධ්‍යයන මාධ්‍යය :**

ශාස්ත්‍රවේදී උපාධියට අදාල දේශන/ සම්මන්ත්‍රණ/ප්‍රායෝගික පරීක්ෂණ/අඛණ්ඩ ඇගයුම් පරීක්ෂණ/සමාසික අවසන් පරීක්ෂණ ආදිය සිංහල මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

04. **පරීක්ෂණයට පෙනී සිටීමට අයදුම් කිරීම**

පරීක්ෂණ සඳහා අයදුම් කළ යුත්තේ, අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයයෙන් ලබා ගන්නා ලද නියමිත ආකෘති පත්‍රයක් (SE -5) මගින් හෝ මාර්ගගත අයදුම්පතක් (Online Application) භාවිතයෙනි.

4.1 **පරීක්ෂණ ගාස්තු**

පරීක්ෂණ ගාස්තු දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ මානව ශාස්ත්‍ර හා සමාජීය

විද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත පාලක සභාව විසින් තීරණය කරනු ලැබේ.

4.2 **පරීක්ෂණ සඳහා ප්‍රවේශ පත්‍ර**

පරීක්ෂණයක් ආරම්භ වීමට අවම වශයෙන් සති දෙකකට පෙර අයදුම්කරුවන් අතුරින් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති සෑම අපේක්ෂකයෙකුටම අදාළ පරීක්ෂණය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබේ. අදාල කාලසීමාව තුළ එවැන්නක් නොලදහොත්, වහාම ඒ බව දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත දැනුම් දිය යුතුය.

4.3 පිළිගත හැකි වෛද්‍ය සහ අනෙකුත් හේතුන් මත අනුමැතිය දී ඇති අවස්ථාවකදී හැර සෑම අපේක්ෂකයෙකුම තමා ලියාපදිංචි වූ සෑම පාඨමාලා ඒකකයකටම එකවර පරීක්ෂණයට ඉදිරිපත් විය යුතුය.

05. **ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.**

විශ්වවිද්‍යාල සනාතන සභාවේ අනුමැතිය ලැබුණු පසු විභාග ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

06. ප්‍රතිඵල නිරවද්‍යතා පරීක්ෂා සිදු කරගැනීමට අවශ්‍ය විද්‍යාර්ථීන් සඳහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිගෙන් ලිඛිත ව නියමිත ආකෘති පත්‍රය (SE – 6) පුරවා සති 02 ක් ඇතුළත ඉල්ලීමක් කළ යුතුය. (ප්‍රතිඵල නිකුත් කළ දින සිට සති 02 ක කාලය ගණනය කරනු ලැබේ.)

07. අවසාන උපාධි පරීක්ෂණයෙහි ප්‍රතිඵල සනාතන සභාව විසින් අනුමත කරනු ලැබූ පසු අදාළ සහතික පත්‍ර උපාධිධාරීන්ට නිකුත් කරනු ලැබේ. පාඨමාලා ඒකක සඳහා සහතික පත්‍ර නිකුත් කරනු නොලැබේ. පරීක්ෂණයක ප්‍රතිඵල සනාතන සභාව විසින් අනුමතකර නිකුත් කරනු ලැබූ පසු, අපේක්ෂකයන්ට දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මගින් සහතික සඳහා අයදුම් කළ හැකිය.

**ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය**
**මාර්ගෝපදේශය අංක 110.1-2022**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය**
**රුහුණ විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී උපාධිය පිළිබඳ අංක 110-2022 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ පිළියෙල කළ අංක 110.1-2022 දරන පාඨමාලා ඒකක ක්‍රමය පිළිබඳ මාර්ගෝපදේශය**

## 1. උපාධි පාඨමාලා ආකෘතිය

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් හඳුන්වා දී ඇති උපාධි පාඨමාලා ආකෘතිය "සමාසික මත පදනම් වූ පාඨමාලා ඒකක ක්‍රමය" (Semester based course units system) ලෙස නම් කෙරේ.

## 2. පාඨමාලා ආකෘතියේ ප්‍රධාන ලක්ෂණ

2.1 අධ්‍යයන වර්ෂයක් සමාසික (semester) දෙකකට බෙදෙනු ලැබෙන අතර එක් සමාසිකයක් සති 15 ක කාලයකින් සමන්විත වේ.

2.2 පාඨමාලා ඒකකයක් (course unit) යනු මනා ව සංවිධානය කරන ලද කිසියම් නිශ්චිත දැනුම් සම්භාරයකි. එය කිසියම් ප්‍රධාන විෂයයක කොටසක් විය හැකි වන අතර එයට පැහැදිලි විෂය සීමාවක් ද ඇත. එබැවින් එබඳු පාඨමාලා ඒකකයක් තුළ නිශ්චිත අරමුණු (objectives) හා අපේක්ෂිත ප්‍රතිඵල (expected outcomes) ද, විෂය අන්තර්ගතය (course contents) ද ඇතුලත් වේ. තව ද එබඳු පාඨමාලා ඒකකවලට ආවේණික වූ ඇගයුම් පටිපාටියක් (method of assessment) ද ඇත. මෙබඳු පාඨමාලා ඒකකයක් හැදෑරීම සඳහා කිසියම් පූර්ව අවශ්‍යතා (prerequisites) සපුරාලිය යුතුව ඇත්නම්, ඒවා ද පාඨමාලා ඒකකයෙහි සඳහන් කරනු ලැබේ.

2.3 කිසියම් සමාසිකයක් තුළ විද්‍යාර්ථියෙකුට හැදෑරීමට ලබා දෙන පාඨමාලා ඒකකයක් ඉගෙනීමට ගත කරන කාලය (couse hours) අනුව එහි අර්ඝ ප්‍රමාණය තීරණය කරනු ලැබේ. ඉගෙනීම සඳහා ගත කරන කාලය වශයෙන් මෙහි දී නිර්වචනය කරනු ලැබෙන්නේ විධිමත් දේශන, සාකච්ඡා, පුනරීක්ෂණ, නිබන්ධන, පරිගණක පාදක හා මාර්ගගත ඉගෙනීම් (Computer-based and on-line learning) වෙනත් කවර හෝ ස්වරූපයක සම්මත විධි යනාදියයි. අර්ඝ එකක් යනු ඉගෙනීම් පැය තිහකි (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932). අර්ඝ 3 ක පාඨමාලාවක් සඳහා විද්‍යාර්ථියා විසින් සමාසිකයදී පැය 45 ක ඉගෙනුම් කාලයක් සම්පූර්ණ කර තිබීම අපේක්ෂිතයි.

2.4 කිසියම් සමාසිකයකට අදාල පාඨමාලා සඳහා ලියාපදිංචිවීමේදී විද්‍යාර්ථියාට නිර්දේශිත සියලු පාඨමාලා සඳහා සමාසිකය ආරම්භයේදී එක්වර ලියාපදිංචි විය යුතුය.

2.5 විශ්වවිද්‍යාල මට්ටමේදී කිසියම් විෂයක් හදාරන විද්‍යාර්ථියකු ඒ විෂය පිළිබඳ ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා තිබිය යුතු කිසියම් අඩු කළ නොහැකි (irreducible) අවම දැනුම් සම්භාරයක් ඇත. එබැවින් කිසියම් දෙන ලද විෂයයක් සඳහා අවශ්‍ය අවම දැනුම් මට්ටම ලබා දීමට යොමු වූ හර පාඨමාලා (core courses) අන්තර්ගත වෙයි.

2.6 විෂය බද්ධ දැනුම වර්ධනය කිරීම සඳහා යොමු වූ හර පාඨමාලා ඒකක වලට අමතරව විද්‍යාර්ථීන් තුළ අනෙකුත් කුසලතා වර්ධනය කිරීමේ අභිප්‍රායෙන් සහ වෘත්තීයාභිමුඛභාවය (job-orientation) ප්‍රවර්ධනය කිරීම් වස් පහත සඳහන් අනිවාර්යයෙන් හැදෑරිය යුතු පදනම් පාඨමාලා සම්පාදනය කරනු ලැබේ. එනම් ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, පරිගණක සාක්ෂරතාව, යන විෂයයන් වේ. මෙම පදනම් පාඨමාලා අනිවාර්යයෙන් ම හැදෑරිය යුතුය.

2.7 අධ්‍යයනාංශවලට අවශ්‍ය පරිදි දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අධ්‍යයන මණ්ඩලයේ සහ පීඨ මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාවේ අනුමැතිය මත විවිධ පාඨමාලා ඒකක වරින් වර හඳුන්වා දීමට පුළුවන.

2.8 සෑම සමාසිකයක් ආරම්භයේදී ම එම සමාසිකයට නියමිත එක් එක් පාඨමාලා ඒකකය සඳහා අදාළ පූර්ව අවශ්‍යතා සහිත විෂය නිර්දේශය, ඇගයුම් පටිපාටිය සහ නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ තොරතුරු දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් විද්‍යාර්ථීන්ට සපයා දෙනු ලැබේ.

## 3. ඇගයුම් ක්‍රමය

3.1 පාඨමාලා ඒකකවල ඇගයුම් ක්‍රමය "ශාස්ත්‍රවේදී උපාධිය පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලයේ අංක 120-2020 දරන අතුරු ව්‍යවස්ථාවේ" 6 වන වගන්තියෙහි 6.3 උපවගන්ති යටතේ ඉදිරිපත් කොට ඇත.

3.2 සමාසිකයට නියමිත අඛණ්ඩ ඇගයුම් සියල්ල එම සමාසිකයේ 15 වන සතිය අවසන් වීමට පෙර සම්පූර්ණ කළ යුතු ය.

3.3 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ විභාග සහ ලියාපදිංචි කිරීම නියෝජ්‍ය අධ්‍යක්ෂ/සම්බන්ධීකාරක විභාග සහ ලියාපදිංචි කිරීම් විසින් අඛණ්ඩ ඇගයුම් සම්බන්ධ සියලු කටයුතු සංවිධානය කරනු ලැබේ.

3.4 වෙනත් අයෙකු විසින් ලියන ලද පැවරුමක් හෝ ඉන් කොටසක් හෝ තමන්ගේ පැවරුමක් ලෙස ඇගයුම් සඳහා ඉදිරිපත් කිරීම පැහැදිලි ලෙස ම විභාග වංචා ගණයේ ලා සලකන අතර, එලෙස ඉදිරිපත් කරනු ලබන පැවරුම්, ඇගයීම සඳහා සලකා නො බලන අතර එවැනි සිද්ධීන් පිළිබඳ තීරණ ගැනීමේ දී විභාග අක්‍රමිකතා කමිටු නිර්දේශ මත සනාතන සභාව වෙත යොමු කරනු ලැබේ.

3.5 කිසියම් විද්‍යාර්ථියෙකු සමාසිකය තුළ හෝ සමාසික අවසාන පරීක්ෂණයක දි යම් විභාග අක්‍රමිකතා සිදු කළ බවට වාර්තා වුව හොත් එවැනි සිද්ධි පිළිබඳ තීරණ ගැනීමේදී විභාග අක්‍රමිකතා කමිටු නිර්දේශ මත සනාතන සභාව වෙත යොමු කරනු ලැබේ.

3.6 සමාසික අවසාන පරීක්ෂණයෙන් අසමත් වූ පාඨමාලා ඒකකයක් සඳහා පුනර් පරීක්ෂණ නොපැවැත්වෙන අතර එම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යයෙන් ම ඊට අදාළ පරීක්ෂණ පැවැත්වෙන ඊළඟ අවස්ථාවක දී ඒ සඳහා පෙනී සිට සාමර්ථ්‍යය ලබා ගත යුතු ය.

4. විද්‍යාර්ථියෙකු ලියාපදිංචි කාලය තුළ පහත සඳහන් හේතු නිසා කිසියම් පරීක්ෂණයකට සහභාගි වීමට අපොහොසත් වන අවස්ථාවල දී ඔහුට/ඇයට ඒ වෙනුවෙන් කරුණු ඉදිරිපත් කළ හැකි ය.

4.1 වෛද්‍ය හෝ සනාථ කළ හැකි වෙනත් හේතු

(අ). විද්‍යාර්ථියා බරපතල ලෙස රෝගාතුර වීම

(ආ). විද්‍යාර්ථියාගේ දෙමව්පියන්ගේ හෝ සහෝදර සහෝදරියකගේ හෝ කලත්‍රයාගේ හෝ දූදරුවන්ගේ හෝ අභාවය

(ඇ). විද්‍යාර්ථියා ආගමික පූජකවරයකු නම් එම විද්‍යාර්ථියාගේ ප්‍රධාන ආගමික ගුරුවරයාගේ අභාවය

(ඈ). විද්‍යාර්ථියකුගේ දරු ප්‍රසූතිය

(ඉ). විද්‍යාර්ථියා අධ්‍යයන හෝ ක්‍රීඩා හෝ සංස්කෘතික කටයුත්තක් හෝ සඳහා ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමින් හෝ සහභාගී වීම.

(ඊ). සනාතන සභාවට පිළිගතහැකි වෙනත් හේතුවක්

4.2 විද්‍යාර්ථියෙකු ඉහත 4.1 හි සඳහන් හේතු එකක් හෝ කිහිපයක් පහත 4.3 හි දැක්වෙන නීත්‍යානුකූල ලිඛිත සාක්ෂි මගින් තහවුරු කර ඉදිරිපත් කළ විට, එම කරුණු සලකා බලා විද්‍යාර්ථියාගේ ඉල්ලීම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ වෛද්‍ය සහතික සලකා බැලීමේ අනුකමිටුවේ නිර්දේශ මත පීඨ මණ්ඩලය මගින් සනාතන සභාව වෙත යොමු කරනු ලැබේ.

4.3 ඉහත 4.1 හි සඳහන් හේතු සමග පහත සඳහන් නීත්‍යානුකූල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ). වෛද්‍ය හේතු නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, අදාළ පරීක්ෂණ දිනය ආවරණය වන පරිදි රජයේ ආරෝග්‍ය ශාලාවකින් හෝ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ). පවුලේ සාමාජිකයකුගේ අභාවයක් නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, අභාවය තහවුරු කිරීම සඳහා මරණ සහතිකය සමග එම ඥාතිත්වය තහවුරු කෙරෙන ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකයක් අවශ්‍ය වේ.

(ඇ). ප්‍රධාන ආගමික ගුරුවරයාගේ අපවත් වීම නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, අපවත් වීම තහවුරු කිරීම සඳහා මරණ සහතිකය සමග එම ගුරු-සිසු සබඳතාවය තහවුරු කෙරෙන ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකයක් අවශ්‍ය වේ.

(ඈ). ක්‍රීඩා හෝ සංස්කෘතික කටයුත්තක් හෝ නිසා ඉල්ලීම සිදු කරන්නේ නම්, එම කටයුත්ත සඳහා සහභාගී වූ බව තහවුරු කිරීමට අදාළ බලධාරීන්ගෙන් ලබා ගත් සහතික ඉදිරිපත් කළ යුතු ය.

(ඉ). වෙනත් හේතුවක් ඉදිරිපත් කරන්නේ නම් එම කාරණය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි නීත්‍යානුකූල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

4.4 මෙම ඉල්ලීම වෛද්‍ය හේතු නිසා ඉදිරිපත් කරන්නේ නම්, 2011/01/20 දින නිකුත් කරන ලද රුහුණ විශ්වවිද්‍යාල අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2011/01 දරන "රුහුණ විශ්වවිද්‍යාලීය අභ්‍යන්තර ශිෂ්‍යයින් සහ සේවක මවතුන් විසින් වෛද්‍ය හේතුන් මත නොපැමිණීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම සඳහා අදාළවන නිර්ණායකයන්" හි 1, 2, 3 සහ 4 යන වගන්තිවලට යටත්ව සිදු කළ යුතු ය.

4.5 ඉහත සිදු කරනු ලබන ඉල්ලීම් අදාළ අධ්‍යයන කටයුතු වෙනුවෙන් වෙන් වූ නිශ්චිත දිනයේ සිට දින 14 ක් ඇතුළත දී දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ (ජ්‍යෙෂ්ඨ) සහකාර ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද 4.1 යටතේ සඳහන් කිසියම් හෝ හේතුවක් නිසා පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වුවහොත් ඒ බව විදුලි පුවතක් මගින් වහාම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත දැනුම් දිය යුතුය. එමෙන්ම එම ඉල්ලීම ලිඛිතව ද දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට දැනුම් දිය යුතුය.

4.6 විද්‍යාර්ථීන් වෛද්‍ය හේතු නිසා ඉල්ලීම් සිදු කර ඇති සෑම විටකදීම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ සහකාර / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් එම වෛද්‍ය සහතික විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරීවරයා වෙත ඉදිරිපත් කර ඔහුගේ නිර්දේශය ලබා ගත යුතුය.

4.7 විවිධාකාරයේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් පෙනී සිටීමට නොහැකිවන විද්‍යාර්ථීන් ඉහත 4.1, 4.3, 4.4 සහ 4.5 හි සඳහන් අවස්ථාවන්ගෙන් බැහැර ව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

## 5. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා ව්‍යුහය.

5.1 ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ තුනකින් සමන්විත වේ.

5.2 ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හදාරන සෑම විද්‍යාර්ථීන් විසින්ම පහත සඳහන් පාඨමාලා වර්ග හැදෑරිය යුතුය.
(අ) හර පාඨමාලා
(ආ) පදනම් පාඨමාලා
(ඇ) අනිවාර්ය සීමාවාසික පුහුණුව

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා එක් එක් පාඨමාලා වර්ගයෙන් හැදෑරිය යුතු අවම පාඨමාලා ඒකක ගණන 110-2022 අතුරු ව්‍යවස්ථාවේ 5.1 උපවගන්තිය යටතේ ඇති වගුව 02 හි දක්වා ඇත.

5.2.1 (i) ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හදාරන සියලුම විද්‍යාර්ථීන් විසින් අනිවාර්ය ඉංග්‍රීසි , අනිවාර්ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පාඨමාලා ඒකක යනාදී පදනම් පාඨමාලා ලෙස හැදෑරිය යුතුයි. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවට ඇතුළත් එම අනිවාර්ය පදනම් පාඨමාලා ඒකක පහත දැක්වේ.

ELG11513 Elements of English Grammar
ITS 12513 Basic Iinformation and Communication Technology Skills
ELG 21513 Reading Skills
ITS 21513 Essential Skills for Digital Presentations
ELG 31513 Academic Writing Skills
ITS 31513 Internet services and web desigining Techniques

5.3 ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ප්‍රධාන විෂයයන් පහත දැක්වේ.

1. පුරා විද්‍යාව
2. බෞද්ධ අධ්‍යයන
3. ආර්ථික විද්‍යාව
4. සමාජ විද්‍යාව
5. භූගෝල විද්‍යාව
6. තොරතුරු සංනිවේදන තාක්‍ෂණය (ICT)
7. ඉතිහාසය
8. පාලි *
9. දේශපාලන විද්‍යාව
10. සිංහල
11. සමාජ සංඛ්‍යානය

* පාලි විෂය තෝරාගැනීම සඳහා එම විෂය අ.පො.ස. උසස් පෙළ සඳහා හැදෑරිය යුතු වේ.

5.4 පාඨමාලා ඒකක තෝරාගැනිම

අයදුම්කරුවන් විසින් ඉහත සඳහන් ප්‍රධාන විෂයන් අතුරින් තුනක් බාහිර උපාධි පාඨමාලාව සඳහා තෝරා ගත යුතුයි. පහත සඳහන් අංක 05 වගුවෙහි දක්වෙන පරිදි පළමු කාණ්ඩයෙන් එක් විෂයයක් පමණක් ද, දෙවැනි සහ තෙවැනි කාණ්ඩවලින් එක් විෂයයක් බැගින් හෝ විෂයයන් දෙකක් බැගින් ද නියෝජනය වන පරිදි විෂයන් තුනක් තෝරා ගත යුතුය. පළමු කාණ්ඩය හැර දෙවැනි හා තෙවැනි කාණ්ඩ දෙකෙන් අඩුම වශයෙන් එක් විෂයක්වත් නියෝජනය වන පරිදි ද විෂයයන් තුනක් තෝරා ගත හැකිය. එහෙත් පළමු කාණ්ඩය තෝරා ගන්නේ නම් එයින් එක් විෂයයකට වඩා තෝරා ගත නොහැකිය. සෑම ස්ථලයකදීම (1000,2000,3000ස්ථල) එනම් අධ්‍යයන වර්ෂ තුනේදීම පළමු ස්ථලයෙහිදී තෝරාගත් විෂය තුනම අඛණ්ඩව 1000,2000,3000 ස්ථලවලදීද තෝරා ගැනීමද සිදු කල යුතුයි.

වගුව 01 - විෂය කාණ්ඩ

| පළමු කාණ්ඩය | දෙවන කාණ්ඩය | තෙවැනි කාණ්ඩය |
|---|---|---|
| සිංහල | සමාජ සංඛ්‍යානය | සමාජ සංඛ්‍යානය |
| සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව | පාලි |
| දේශපාලන විද්‍යාව | භූගෝල විද්‍යාව | බෞද්ධ අධ්‍යයන |
| ඉතිහාසය | පුරා විද්‍යාව | පුරා විද්‍යාව |
| | පාලි | ආර්ථික විද්‍යාව |
| | තොරතුරු සංනිවේදන තාක්‍ෂණය(ICT) | |

## 6. පාඨමාලා ඒකක හැඳින්වීමේ කේත

විෂය සම්බන්ධිත සෑම පාඨමාලා ඒකකයක්ම හැඳින්වීමට කේත අක්ෂර 3 ක් හා අංක 5 ක් සහිත සංකේතයක් භාවිත කෙරේ. කේත අක්ෂර වශයෙන් අදාළ විෂයය හෝ අධ්‍යයනාංශය හෝ ඒකකය හෝ පිළිබිඹු කෙරෙන අක්ෂර තුනක් ද, කේත අංකය වශයෙන් වර්ෂය හෝ ස්ථලය (academic year or level), සමාසිකය (semester), අධ්‍යයන පාඨමාලාවේ යෝග්‍යතා මට්ටම (the qualification type), පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය (course unit serial number) හා පාඨමාලා ඒකකයට හිමි අර්ස ප්‍රමාණය (number of credits) නියෝජනය කෙරෙන අංක 5 ක් යොදා ගනී. පදනම් පාඨමාලා ඒකක හැඳින්වීමට ඒ ඒ විෂයන්ට ආවේණික කේත මුල් අක්ෂර 3 මගින් දැක්වේ.

උදාහරණයඃ

| අධ්‍යයනාංශය/ඒකකය/විෂයය | සංකේතය |
|---|---|
| ආර්ථික විද්‍යාව | ECN |
| භූගෝලවිද්‍යාව | GEO |
| ඉංග්‍රීසි ප්‍රවීණතාව | ENG |

**සූචියඃ**

| ආරම්භක ඉංග්‍රීසි අකුරු 3 | විෂයය (Subject) |
|---|---|
| පළමු ඉලක්කම (සිව් වැනි අකුර) | උපාධි පාඨමාලාවේ අධ්‍යයන වර්ෂය (academic year or level) |
| දෙවන ඉලක්කම (පස්වන අකුර) | උපාධි පාඨමාලාවේ අධ්‍යයන වර්ෂයෙහි සමාසිකය (semester) |
| තෙවන ඉලක්කම (හයවන අකුර) | උපාධි පාඨමාලාවේ යෝග්‍යතා මට්ටම (the qualification types) |
| සිව්වන ඉලක්කම (හත්වන අකුර) | සමාසිකයෙහි ආදාල විෂයයෙහි පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය (course unit serial number) |
| පස්වන ඉලක්කම (අටවන අකුර) | පාඨමාලා ඒකකයට හිමි අර්ස ප්‍රමාණය (Number of credits) |

උදාහරණයක් වශයෙන් ECN 12523 නැමැති කේත අංකයෙන් අදහස් කෙරෙනුයේ ආර්ථික විද්‍යා විෂය පිළිබඳ බාහිර උපාධි පාඨමාලාවේ ප්‍රථම වර්ෂයේ දෙවන සමාසිකය තුළ පවත්වනු ලැබෙන උපාධි මට්ටමේ (5) දෙවන පාඨමාලා ඒකකය වන බව සහ එයට අර්ස 3 ක් හිමි වන බවය. GEO 22513 යන්නෙන් අදහස් වනුයේ භූගෝල විද්‍යාව විෂය පිළිබඳ බාහිර උපාධි පාඨමාලාවේ දෙවන වර්ෂයේ දෙවන සමාසිකයේ සාමාන්‍ය උපාධි මට්ටමේ (5) පවත්වනු ලැබෙන පළමුවන පාඨමාලා ඒකකය වන බව සහ එයට අර්ස 3 ක් හිමි වන බවය.

## 7. පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීම

7.1 පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචිය සම්බන්ධ නීතිරීති අතුරු ව්‍යවස්ථාවේ 4 වගන්තියේ සඳහන් වේ.

7.2 අතුරු ව්‍යවස්ථාවෙහි 4.1 වගන්තියෙහි සඳහන් කරන ලද එක් එක් සමාසිකයේ දී තෝරා ගත යුතු අවම පාඨමාලා ඒකක ප්‍රමාණය සහ එම ඒකක තෝරා ගත යුතු පිළිවෙළ අතුරු ව්‍යවස්ථාවේ වගුව 2 හි සඳහන් වේ.

7.3 (අ) ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා සඳහා අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන විෂයයන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට හදාරා තිබීම පූර්ව අවශ්‍යතාවක් නොවේ. එහෙත් ඇතැම් විෂයයන් තෝරා ගැනීමේ දී ඒ සමඟම හැදෑරිය යුතු වෙනත් පාඨමාලා ඒකක පිළිබඳ ව පූර්ව අවශ්‍යතා හෝ අ.පො.ස. උසස් පෙළ සඳහා ඒ විෂය හදාරා තිබීමේ අවශ්‍යතාව හෝ අධ්‍යයනාංශ විසින් නියම කොට තිබිය හැකි ය. එබැවින්

පූර්ව අවශ්‍යතා අපේක්ෂිත පාඨමාලා ඒකක තෝරා ගැනීමේ දී ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස විද්‍යාර්ථීන්ට උපදෙස් දෙනු ලැබේ.

(ආ) ප්‍රධාන විෂයවලට අදාළ හර පාඨමාලාවලට අතිරේකව පදනම් පාඨමාලා ඒකක ද හැදෑරීමට නිර්දේශ කරනු ලැබේ.

(ඇ) පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි වීමට ඒ සඳහා විශේෂයෙන් සකසන ලද SE - 1 ආකෘති පත්‍රය හෝ මාර්ග ගත (on line) ක්‍රමයට ලියාපදිංචි වන්නේ නම් අදාල වෙබ් අඩවියේ ඒ සඳහා ඇති මාර්ග ගත (on line) පෝරමය යොදා ගත යුතු ය. සියළුම සිසුන් සමාසික ආරම්භයේ සිට සති 02 ක කාලයක් තුළ සමාසිකය සඳහා ලියාපදිංචි විය යුතුය.

**7.4. අධ්‍යයන වර්ෂයක් කල් ලබා ගැනීම**

අතුරු ව්‍යවස්ථාවෙහි 4 වගන්තියෙහි 4.1.2 උප වගන්තිය අනුව අධ්‍යයන වර්ෂයක් කල් ලබා ගැනීමට අවශ්‍ය කිසියම් විද්‍යාර්ථියෙකු ඒ සඳහා SE-3 ආකෘති පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.

**8. සමාසික ඉගැනුම් සැලැස්ම**

සෑම පාඨමාලා ඒකකයක් සඳහාම දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් පාඨමාලා විස්තරයක් (C-1 පත්‍රිකාව) පිළියෙල කොට පාඨමාලාව ආරම්භ කරන අවස්ථාවේ දී විද්‍යාර්ථීන්ට ලබා දෙනු ලැබේ. ඒ පාඨමාලා විස්තරය තුළ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

1. පාඨමාලාවේ දී ආවරණය කෙරෙන මාතෘකා
2. ඒ මාතෘකා සඳහා දේශන/ සම්මන්ත්‍රණ පැවැත්වෙන දින සහ වේලාව
3. ඒවාට අදාළ කියවීම් ලේඛන
4. අඛණ්ඩ ඇගයුම් සඳහා යොදා ගැනෙන ක්‍රම හා සම්පූර්ණ කළ යුතු දින

පාඨමාලා ඒකක සඳහා අදාළ විෂය නිර්දේශ සහ ඇගයුම් ක්‍රම සනාතන සභාව විසින් අනුමත කළ යුතු වේ. ඇගැයුම් කිරීම සඳහා යොදා ගැනෙන ලකුණු පරාස, ශ්‍රේණි හා ශ්‍රේණි ලක්ෂ්‍ය පිළිබඳ විස්තර ඉහත 3.1 වගන්තියෙහි සඳහන් කරන ලද අතුරු ව්‍යවස්ථාවේ 6.3 වන ඡේදය යටතේ දක්වා ඇත.

**9. මෙම නියෝග හා නිර්ණායක අතුරු ව්‍යවස්ථාවේ 2019/2020 වර්ෂයේ සිට බඳවා ගනු ලබන 19 වන ශිෂ්‍ය කණ්ඩායමේ සිට ක්‍රියාත්මක වනු ඇත.**